**ගම්පහ අධ්‍යාපන කලාපය**
**පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් - කාර්ය පත්‍රිකා අංක 04**
**අප අවට සත්තු**

**5ශ්‍රේණිය** **කාලය පැය 1 මිනිත්තු 30**

**01. නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**


1. ජලයේ පමණක් ජීවත්වන සතෙකි.
   (i) ඉබ්බා (ii) ගෙම්බා (iii) ඉස්සා (iv) දියකාවා

2. ක්ෂීරපායි සත්ත්වයෙකු හඳුනාගත හැකි ලක්ෂණයක් වන්නේ,
   (i) බිත්තරවලින් පැටවුන් බිහිකිරීම. (ii) මව්කිරි බී පෝෂණය වීම.
   (iii) ශාක ද්‍රව්‍ය පමණක් ආහාරයට ගැනීම. (iv) ගොඩබිම පමණක් ජීවත්වීම.

3. මල් පරාගනය සඳහා උදවු නොවන සතෙකි.
   (i) කනෙයියා මැස්සා (ii) බඹරා (iii) මී මැස්සා (iv) කපුටා

4. සතුන් මගින් ශාකවලට සිදුවන යහපත් ක්‍රියාවක් වන්නේ,
   (i) දිමියන් ශාකපත්‍ර එකතුකර දිමිගොටු සෑදීම.
   (ii) වවුලන් ශාකවල බීජ තැන තැන දැමීම.
   (iii) ඉත්තෑවන් ශාකවල අල, මුල් ආහාරයට ගැනීම.
   (iv) සමහර සතුන් වනයේ ශාක පෙරළා දැමීම.

5. පැළෑටිවල පත්‍ර ආහාරයට ගන්නා සතෙකි.
   (i) බකමූණා (ii) උකුස්සා (iii) සමනලයා (iv) දළඹුවා

6. 
   රූපයෙන් දැක්වෙන සත්ත්වයා වන්නේ,
   (i) කොරවක්කා (ii) තාරාවා
   (iii) කිරලා (iv) කොකා

7. කොම්පෝස්ට් පොහොර නිපදවා ගැනීමට උදවු කරන සතෙකි.
   (i) ගවයා (ii) බල්ලා (iii) ඇටිකුකුළා (iv) පූසා

8. පෘෂ්ටයකට ඇලී සිටීම සඳහා විශේෂ පාද සහිත සතෙකු වන්නේ,
   (i) තලගොයා (ii) කබරගොයා (iii) හූනා (iv) කටුස්සා


9. රාත්‍රී කාලයේ පමණක් හැසිරෙන සත්ත්වයෙකු වන්නේ,
   (i) උලමා (ii) කෑරලා (iii) පිළිහුඩුවා (iv) කොවුලා

10. පරිසරයට අලංකාරයක් හා මානසික සුවයක් ලබාදෙන සතුන් වර්ගයකි.
   (i) බල්ලන් (ii) ගවයින් (iii) බළලුන් (iv) ඇතිකරන මසුන්


( ලකුණු 1 x 10 = 10 )

02. **නිවසේ සහ ගෙවත්තේ සැරිසරන සතුන්ගේ රූප සටහන් පහත දැක්වේ. කොටුවේ ඇති නම් අතරින් එම සතුන් තෝරා තිත් ඉරමත ලියන්න.**


(i)




(ii)



(iii)



(iv)



............................ ............................ ............................ ............................

| ගෙමැස්සා / මීමැස්සා / බත්කූරා / කැරපොත්තා / සමනලයා / මකුළුවා / වේයා |
|---|

( ලකුණු 2 x 4 = 8 )

03. **පහත සඳහන් වගන්ති හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

(i) වවුලා පියෑඹිය හැකි ක්ෂීරපායි සතෙකි. ( )

(ii) ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා වලිකුකුළා ය. ( )

(iii) ගිරවා ගස්වල බෙන සාදයි. ( )

(iv) සෑම කෘමි සතෙකුට ම පියාඹා යා හැකිය. ( )

(v) මීමැස්සා, මදුරුවා, කුරුමිණියා වායව පරිසරයේ වෙසෙන සතුන් වේ. ( )

(vi) තුරගා වන්නමෙන් වඳුරාගේ ගමන් විලාසය ගැන කියවේ. ( )

(vii) වනාන්තර ගිනි තැබීම නිසා සතුන්ට හානි සිදු නොවේ. ( )

(viii) හැකරැල්ලා බහුපාද සහිත සතෙකි. ( )


(ix) පරිසරයේ ඇති සතුන් ආරක්ෂා කරමින්
රැක බලා ගැනීම අප කාගේත් යුතුකමක් වේ. ( )

(x) ඉවත දමන කඩදාසි, ගොක්කොළ,
විවිධ ශාක කොටස් මගින් සත්ත්ව රූප නිර්මාණය කළ හැකිය. ( )


( ලකුණු 1 x 10 = 10 )

04. **පහත දැක්වෙන සත්ත්ව අනුකරණ චලන හඳුනාගෙන එයට අදාළ අංකය තිත් ඉරමත ලියන්න.**


(i)




(ii)



(iii)



(iv)



............................ ............................ ............................ ............................

| | |
|---|---|
| 1. අලියාගේ ගමන් කිරීම. | 2. වඳුරෙකු සේ පැන පැන යාම |
| 3. කකුළුවෙකුසේ ගමන් කිරීම. | 4. දළඹුවෙකුසේ ගමන් කිරීම. |

( ලකුණු 2 x 4 = 8 )


**05. සතුන්ගේ පැවැත්ම සඳහා ඉවහල්වන ශරීර ලක්ෂණ අනුව, සතුන් හඳුනාගෙන සුදුසු පරිදි යා කරන්න.**

| | |
|---|---|
| 1. මත්ස්‍යයෝ | i. ආරක්ෂාව සඳහා කටුව තුළ සැඟවීම. |
| 2. පක්ෂීහු | ii. ගොදුර සොයා ගැනීමට රැවුළු කෙඳි තිබීම. |
| 3. කටුස්සා | iii. පිහිනීම සඳහා වරල් තිබීම. |
| 4. ඉබ්බා | iv. පියෑඹීම සඳහා පිහාටු පියාපත් තිබීම. |
| 5. පූසා | v. ආරක්ෂාව සඳහා සමේ වර්ණය වෙනස් කිරීම. |

( ලකුණු 2 x 5 = 10 )

**06. පහත දී ඇති සත්ත්ව සෙවණැලි හඳුනාගෙන, අදාළ නම වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

(i) (ii) (iii) (iv) (v)



...................... ...................... ...................... ...................... ......................

( පිළිහුඩුවා , දියකාවා , කොරවක්කා , කපුටා , කෑදැත්තා )

( ලකුණු 2 x 5 = 10 )

**07. නිවැරදි පිළිතුරට යටින් ඉරක් අඳින්න.**

1. පියාපත් විනිවිද පෙනෙන කෘමි සතෙකි. ( ගෙමැස්සා , බත්කූරා )
2. බිත්තර මගින් බිහිවන සතෙකි. ( හූනා , වවුලා )
3. කෘමි සතෙකුට පාද යුගල. ( 6 කි , 3 කි )
4. වගාවට හානිකරන ගොලුබෙල්ලන් ආහාරයට ගනියි. ( ඇටිකුකුළා , ඉත්තෑවා )
5. පස සාරවත් කිරීමට උදවු කරන සතෙකි. ( පත්තෑයා , ගැඩවිලා )
6. වේගයෙන් දිවීමට හැකි පක්ෂියෙකි. ( පැස්බරා , මොනරා )
7. මිනිසුන්ට හිතවත්ය. පුරු පුරු ගායි. නිවසෙහි වෙසෙයි. ( බල්ලා , පූසා )
8. සත්ත්ව අනුකරණ චලන සිදුකිරීමේ වාසියකි.
   ( පේශි ශක්තිය සංවර්ධනය වීම , අත් පා හා සන්ධි ආබාධ ඇතිවීම)

( ලකුණු 1 x 8 = 8 )

**08. පහත කොටුවේ දැක්වෙන අපේ රටට ආවේණික සතුන් වර්ග කර, වගුවේ අදාළ තැන්හි ලියා දක්වන්න.**

| |
|---|
| යක් කටුස්සා , කලවැද්දා , හික්මීයා , මල්පුලුට්ටා , ගල්පාඬියා<br>දිය නයා , බුලත්හපයා , වලි කුකුළා , කළු වඳුරා , හබන් කුකුළා |

| පක්ෂීන් | ක්ෂීරපායින් | උරගයෝ | මත්ස්‍යයෝ |
|---|---|---|---|
| i. | i. | i. | i. |
| ii. | ii. | ii. | ii. |
| | iii. | | iii. |

( ලකුණු 1 x 10 = 10 )

**09. කෙටි පිළිතුරු සපයන්න.**

1. සතුන් මගින් මිනිසාට ලබාදෙන දේ බොහෝ ය. ඒ අනුව මිනිසා ද සතුන්ට ලබාදිය යුතු දේවල් 2 ක් නම් කරන්න.

   (i) ........................................................................................................................

   (ii) ........................................................................................................................

2. මිනිසාට ආර්ථික වාසි ලබාදෙන සතුන් දෙදෙනෙක් නම් කර ලැබෙන වාසිය ඉදිරියෙන් ලියන්න.

| | සතා | වාසිය |
|---|---|---|
| (i) | .............................................. | ............................................................ |
| (ii) | .............................................. | ............................................................ |

3. සතුන් ගන්නා ආහාර අනුව කාණ්ඩ තුනකට වෙන්කරයි. එම කාණ්ඩ නම් කර එයට අයත් සතුන් එක බැගින් නම් කරන්න.

| | කාණ්ඩය | සතා |
|---|---|---|
| (i) | .............................................. | ............................................................ |
| (ii) | .............................................. | ............................................................ |
| (iii) | .............................................. | ............................................................ |

4. මිනිසාගේ විවිධ ක්‍රියාකාරකම් නිසා සතුන්ට වන හානි 2 ක් ලියන්න.

   (i) ........................................................................................................................

   (ii) ........................................................................................................................

5. සතුන්ගේ යහපත් ගුණාංග ඇසුරෙන් අපට ලබාගත හැකි ආදර්ශ 2 ක් ලියන්න.

   (i) ........................................................................................................................

   (ii) ........................................................................................................................

6. සතුන්ගේ ගමන් විලාස ගැන කියවෙන පහත වන්නම සම්පූර්ණ කරන්න.

   වනපැත්ත බියපත්ව සයනම්//

   දුටත් යනෙන විටත් දුවන

   .................................................................

   .................................................................

( ලකුණු 2 x 13 = 26 )

**ගම්පහ අධ්‍යාපන කලාපය**

**පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් - කාර්ය පත්‍රිකා අංක 04**

**අප අවට සත්තු**

---

**පිළිතුරු පත්‍රය**

**01.** 1. iii 2. ii 3. iv 4. ii 5. iv 6. ii 7. i 8. iii 9. i 10. iv
( ලකුණු 1 x 10 = 10 )

**02.** i. මකුළුවා ii. සමනලයා iii. බත්කූරා iv. කැරපොත්තා
( ලකුණු 2 x 4 = 08 )

**03.** i. ✓ ii. ✓ iii. × iv. × v. ✓ vi. × vii. × viii. ✓ ix. ✓ x. ✓
( ලකුණු 1 x 10 = 10 )

**04.** i. 2 ii. 3 iii. 4 iv. 1 ( ලකුණු 2 x 4 = 08 )

**05.** 1. iii 2. iv 3. v 4. i 5. ii ( ලකුණු 2 x 5 = 10 )

**06.** i. දියකාවා ii. කපුටා iii. පිළිහුඩුවා iv. කෑදැත්තා v. කොරවක්කා
( ලකුණු 2 x 5 = 10 )

**07.** 1. බත්කූරා 2. හූනා 3. 3 කි 4. ඇටිකුකුළා
5. ගැඩවිලා 6. පැස්බරා 7. පූසා 8. පේෂි ශක්තිය සංවර්ධනය වීම
( ලකුණු 1 x 8 = 08 )

**08.** **පක්ෂීන්** - වලි කුකුළා, හබන් කුකුළා **ක්ෂීරපායීන්** - කලවැද්දා, හික්මීයා, කළු වඳුරා
**උරගයෝ** - යක් කටුස්සා, දිය නයා **මත්ස්‍යයෝ** - මල්පුලුට්ටා, ගල්පාඩියා, බුලත්හපයා
( ලකුණු 1 x 10 = 10 )

**09.** 1. i. ආහාර පාන ලබාදීම. ii. ඖෂධ ලබාදීම. iii. ආදරය, කරුණාව ලබාදීම.
iv. වාසස්ථාන ලබාදීම. v. පිරිසිදු කිරීම.

2. i. එළදෙන - කිරි ලබාදීම
කිකිළි/කුකුළා - බිත්තර ලබාදීම / මස් ලබාදීම

3. i. ශාක භක්ෂක - අලියා , අශ්වයා
මාංස භක්ෂක - සිංහයා , කොටියා
සර්ව භක්ෂක - බල්ලා , කපුටා

4. i. ගස් කැපීම / කැලෑ එළිකිරීම නිසා වාසස්ථාන, ආහාර නැතිවීම
ii. සතුන් දඩයම් කිරීම නිසා වටිනා සතුන් අහිමි වීම.
iii. වනාන්තර ගිනි තැබීම නිසා සතුන් විනාශ වී යාම.

5. i. සාමූහික බව ii. එකිනෙකාට පිහිට වීම. iii. බෙදා හදා ගැනීම.

6. පිටත් පොටගසා පනිමින
තැන නාඩි ඉඳ වාඩි වෙව්ලුම් ( ලකුණු 2 x 13 = 26 )